# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 2.7 කින් වර්ධනය වේ.

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2019 වර්ෂයේ තෙවන කාර්තුව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

……………………………………………………………………………………………


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 තෙවන කාර්තුව (ජුලි, අගෝස්තු,සැප්තැම්බර්) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

2019 වර්ෂයේ තෙවන කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු මගින් ද විශේෂයෙන් සේවා අංශයේ 'නවාතැන් සැපයීමේ හා ආහාරපාන සැපයීමේ සේවාව' මගින් 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ඉරිදා දින සිද්ධිය මගින් ඇති වූ අහිතකර බලපෑම තවදුරටත් පිළිබිඹු වේ. ඒ අනුව 'නවාතැන් සැපයීමේ හා ආහාරපාන සැපයීමේ සේවාව' 2018 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම අහිතකර බලපෑම යටතේ තවදුරටත් ඍණ වර්ධනයක් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2019 තෙවන කාර්තුව සඳහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 2.7 කි. 2019 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 4,027,051 ක් සහ රුපියල් මිලියන 2,507,363 ක් වශයෙන් වාර්තා වන අතර 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී මෙම අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 3,692,822ක් සහ රුපියල් මිලියන 2,441,796 ක් වශයෙන් වාර්තා විය.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 6.9 ක්, සියයට 26.8 ක්, සියයට 60.0 ක් සහ සියයට 6.2 ක් ලෙස වාර්තා වේ. 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිලිවෙලින් සියයට 3.3 ක සහ සියයට 2.8 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 0.4 ක සුළු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.

**රූප සටහන 1: 2018 සහ 2019 වර්ෂයන් හි තෙවන කාර්තුවේ වර්ධන වේගයන් සැසඳීම**




කෘෂිකාර්මික ආර්ථික කටයුතු අතුරින් "පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව", "මිරිදිය ධීවර කර්මාන්තය", "තේ වගා කිරීම" සහ "වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම" පිළිවෙලින් සියයට 13.9ක් , සියයට 10.9, සියයට 10.0 ක් සහ 8.1 ක් වශයෙන් කැපී පෙනෙන ධන වර්ධනයන් 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. එසේ ම තව දුරටත් "එළවළු වගා කිරීම", " වනවගා සහ දැව", "පළතුරු වගා කිරීම" සහ "අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම", මෙම කාර්තුවේ දී පිළිවෙලින් සියයට 5.1, සියයට 3.6, සියයට 3.5, සහ සියයට 3.1ක් ලෙස සැලකිය යුතු ධන වර්ධනයන් වාර්තා කර ඇත. එසේ වුවද ප්‍රධාන කෘෂි ආර්ථික බෝග වන "රබර් වගා කිරීම" , "පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්", කරදිය මත්ස්‍ය කර්මාන්තය, "සත්ව නිෂ්පාදන" සහ " වී වගාව" යන කෘෂි ආර්ථික ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 19.9 ක්, සියයට 13.7ක්, සියයට 8.2 ක්, සියයට 6.2ක්, සහ සියයට 4.3 ක් වශයෙන් සෘන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු 2019 වර්ෂයේ තෙවන කාර්තුව තුල දී සියයට 26.8ක දායකත්වයක් දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි ලබාදී ඇති අතර සියයට 3.3 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී සමස්ත නිමවුම් කර්මාන්ත සියයට 2.5කින් වර්ධනයක් වාර්තා කරයි. මේ සඳහා "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන", "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" සියයට 5.0ක සහ සියයට 5.1කින් දායකත්වය සපයා ඇත. එසේම "අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන" සහ "රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" පිළිවෙලින් සියයට 9.3ක සහ 1.5 ක ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. 2019 තෙවන කාර්තුව තුලදී "කඩදාසි නිෂ්පාදන" , "මූලික ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන" "වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම" සහ "ගෘහ භාණ්ඩ නිෂ්පාදන" පිළිවෙලින් සියයට 8.2ක්, සියයට 7.3ක්, සියයට 6.1ක් සහ සියයට 5.3ක් වශයෙන් සෘන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

අනෙකුත් ප්‍රධාන කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් සියයට 2.2ක් සහ සියයට 6.7ක් වශයෙන් ඉහල දායකත්වයක් ලබා දෙන "පතල් හා කැනීම්" සහ "ඉදිකිරීම්" 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී පිළිවෙලින් සියයට 5.0ක් සහ සියයට 4.6ක වර්ධනයන් වාර්තා කර ඇත. මීට අමතරව "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම ", "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම", "අපවහන පද්ධති" සහ "ඉදිකිරීම්" පිළිවෙලින් සියයට 1.5ක්, සියයට 4.9ක්, සහ සියයට 8.5ක් වශයෙනන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 60ක ඉහල දායකත්වයක් ලබා දෙන සේවා අංශය සියයට 2.8ක වර්ධනයක් වාර්තා කොට ඇත. මේ සඳහා "තොග හා සිල්ලර

වෙළඳාම" , "ප්‍රවාහනය" , "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා" සහ "අනෙකුත් පෞද්ගලික සේවා" ඉහල දායකත්වයක් සපයා ඇත. මෙම ආර්ථික කාර්යයන් පිලිවෙලින් සියයට 2.1, සියයට 1.4ක, සියයට 6.9ක සහ සියයට 3.0ක වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව දුරටත් දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 0.2ක සුළු දායකත්වයක් සපයන කිරීමට "තොරතුරු තාක්ෂණ සේවා" ආර්ථික කටයුත්ත 2018 තෙවන කාර්තුවට සාපේක්ෂව 2019 තෙවන කාර්තුව තුලදී සියයට 20.5 ඉහල වර්ධන වේගයක් වාර්තා කිරීමට සමත් වී ඇත. එසේම "විදුලි සංදේශ සේවා" සියයට 11.1 ක් ඉහළ වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර "ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම" සියයට 7.5ක් වශයෙන් පසුබැසීමක් 2018 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී වාර්තා කර ඇත. මීට හේතුව වන්නේ තව දුරටත් පාස්කු ඉරිදා ප්‍රහාරයේ අහිතකර බලපෑම් වේ.

2019 තෙවන කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

I.R. Bandara

ආචාර්ය අයි. ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්